ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு – 08.
24/4, **Castle street , Colombo - 08.**

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2014.10.07

සියළුම දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති කළමනාකරුවන් වෙත,

**<u>2014 අයවැය යෝජනා මඟින් හඳුන්වාදෙනු ලැබූ රජයේ නිලධාරින්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ට දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති විසින් හඳුන්වාදෙනු ලබන රු. 50,000/- ණය යෝජනා ක්‍රමය</u>**

1. **හැඳින්වීම**
   මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මැදිහත්වීම මත රජයේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා සහනදායි මිලකට ලබාදෙනු ලබන යතුරුපැදි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ද ලබාදෙනු ලබන පසුබිම තුල දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතිය විසින් සහනදායි පොලි අනුපාතයක් මත රු. 50,000/- ක උපරිමයට යටත්ව ණය මුදලක් ලබාදීමට කටයුතු කෙරේ.

2. **අරමුණ**

   2.1 සේවක අභිප්‍රේරණයක් ඇති වන පරිදි දිවිනැගුම ප්‍රජා මුල බැංකු වැඩසටහනයටතේ සහනදායි ණය මුදලක් ලබාගැනීමට පසුබිම ඇති කිරීම.
   2.2 දිළිඳුකම අවම කිරීමට හා ප්‍රජාවගේ ජීවන මට්ටටම උසස් කිරීමට සෘජු දායකත්වයක් සපයන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කාර්යය පහසුව ඇති කිරීම.
   2.3 රජයේ නිලධාරින්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා රජය ගෙන යනු ලබන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට දිවිනැගුම ප්‍රජා මුල බැංකු සහ බැංකු සමිතිවල දායකත්වය ලබාදීම.

3. **යෝග්‍යතාවය**

   3.1 මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අයවැය චක්‍ර ලේඛ අංක 2/2014 අනුව සුදුසුකම් ලබන නිලධාරින් අතරින්,
   3.2 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සේවයකුවීම හා ඉදිරි සේවා කාලය අවම වශයෙන් අවුරුදු 2 ක් තිබීම. (විශ්‍රාම ලැබීමට පෙර )

4. **ණය සීමාව, පොලි අනුපාතය හා ආපසු ගෙවීමේ කාලය.**

   4.1 උපරිම ණය මුදල - රු. 50,000/- කි.
   4.2 ණය ආපසු ගෙවීමේ කාලය - මාස 48
   4.3 වාර්ෂික පොලි අනුපාතය - 6.5%
   4.4 ණයකරුගේ ස්වකීය කැමැත්ත මත ආපසු ගෙවීමේ කාලය මාස 48 , 36, 24 ක් අතරින් එකක් තෝරා ගත හැක.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2669703 | 011- 2669700 | 011-2685888 | 011-2669725 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2669709 | 011-2678203 | 011-2695579 | 011-2669725 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | hrddivineguma@gmail.com | divinegumaaccbranch@gmail.com | |

## 5. අරමුදල් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

5.1 මෙම විශේෂ ණය වැඩසටහන දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති හරහා ක්‍රියාත්මකවේ. ඒ සඳහා අවශ්‍ය අරමුදල් දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතිවල කේත අංක 9404 දරණ ගිණුමේ ඇති ශේෂයන් පදනම් කරගෙන ක්‍රියාත්මක කළ යුතුය.

5.2 බැංකු සමිති බල ප්‍රදේශයට අයත් නිලධාරින්ට ණය අරමුදල් සැපයීමට ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවකදී දිස්ත්‍රික්කයේ බැංකු හා බැංකු සමිති විෂය භාර දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරියා විසින් සමස්ත දිස්ත්‍රික්කයේ ණය අවශ්‍යතාවය සලකා අතිරික්ත අරමුදල් ඇති දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති වෙත ණය අයදුම්කරු යොමු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. මෙහිදි නිලධාරියා අපහසුතාවයට පත් නොවන අයුරින් කටයුතු කිරීම ඒ ඒ දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති කළමනාකරු හා දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරින් වග බලාගත යුතුය.

5.2 පුද්ගලික මුදලින් දැනටමත් මෙම වැඩසටහන යටතේ, යතුරු පැදි ලබාගත් නිලධාරින් අදාල මුදල මෙම ණය වැඩසටහන යටතේ ප්‍රතිපූර්ණය කිරීම ඉඩදෙනු ලැබේ.

## 6. ණය අයදුම්කරු සපුරා ගත යුතු කොන්දේසි.

6.1 ණය මුදලේ වාරිකය අයදුම්කරුගේ වැටුපෙන් මාසිකව අය කළ යුතු අතර, සේවකයාගේ සියළු අඩු කිරීම් ණය මුදලේ වාරික හා පොලිය සමඟ එකතුව 40% නොඉක්ම විය යුතුය.

6.2 6.1 හි සුදුසුකම් සපුරන රජයේ නිලධාරින් දෙදෙනකු ඇප වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

6.3 නිලධාරියකුට ලබාදෙන ලබන පුද්ගලික ණයක් ලෙස මෙම ණය ලබාදිය යුතු අතර, දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතියේ දිවිනැගුම ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුමක් ණය අයදුම්කරු විවෘත කළ යුතුය. ආරම්භක තැන්පතු මුදල රු. 500/- ක් වේ.

## 7. ණය අයදුම්කිරිමේ බල ප්‍රදේශය

7.1 ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයකට අයත් නිලධාරියකු තම බල ප්‍රදේශයට අයත් දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතියෙන් ණය අයදුම් කළ යුතුය.

7.2 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිස්ත්‍රික්ක කාර්යාල හෝ වෙනත් කාර්යාලයක සේවයේ නියුතු අය ඔවුන් ස්ථිර පදිංචි ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයට අයත් දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිතියෙන් ණය අයදුම් කළ යුතුය.

## 8. ණය අයදුම් කිරීමේදී භාවිතා කළ යුතු ලියවිලි හා අයදුම් පත්‍ර.

8.1 ණය අයදුම් පත්‍රය (ඇමුණුම 01 හි සඳහන් ආකෘති පත්‍රය)
8.2 මාසික වැටුපෙන් අවකරණය කිරීමට කැමැත්ත දැක් වු ලිපිය. (ඇමුණුම් - 02)
8.3 ණය ගිවිසුම් පත්‍රය. (ඇමුණුම 03)
8.4 ඇපකරු ප්‍රකාශය ණය ලබාගත් නිලධාරින්, පිළිබඳ අදාල අංශවලට යොමු කරන ලිපිය (ඇමුණුම - 04)
8.5 ණය හා වාරික අය කිරීමේ ක්‍රමවේදය. (ඇමුණුම - 05.1 , 05.2, 05.3, 05.04)
8.6 සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
8.7 ණය ලබාගත් නිලධාරීන් පිළිබඳ අදාල අංශ වෙත යොමු කරන ලිපිය. (ඇමුණුම - 06)

**9.** **ණය මුදල නිදහස් කිරිමේදී අදාල ගිණුම් සටහන්**

හර - ලැබිය යුතු ණය ගිණුම - සේවක යතුරු පැදි (කේත අංක 7102)
බැර - මුදල්/ ජංගම ගිණුම

ණය මුදල් නිදහස් කිරීමේදී, පුද්ගලික ණය ලෙජර් ණය කාඩ් , ණය තොරතුරු රෙජිස්තර් හා ණය පාලන ලෙජර්වල සටහන් කළ යුතුය.

මාසික ණය වාරික අයකර ගැනීමේදී, ලැබෙන චෙක්පත් බැංකු ගත කර උපලබ්ධි වූ පසු පහත ගිණුම් සටහන් තබා වාරික හා පොලිය අයකර ගත යුතුය.

හර - ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම
බැර - දිවිනැගුම ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුම
හර - දිවිනැගුම ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුම
බැර - ලද පොලි දුන් ණය ගිණුම (කේත අංක 5007)
බැර - ලැබිය යුතු ණය ගිණුම සේවක යතුරුපැදි (කේත අංක 7102)

ඉන් අනතුරුව පුද්ගලික ලෙජර් සහ අනිකුත් පාලන හා ණය කාඩ්වල සටහන් තැබීමට කටයුතු කළ යුතුය.

10. ණය මුදල ආපසු ගෙවීමට පොරොන්දු වූ දිනය නොසලකා හැර අදාල කාර්යාලය හෝ දිවිනැගුම කාර්යාල වලින් වාරික මුදලට අදාල චෙක්පත ලද දිනය ණය වාරිකය හා පොලිය ගෙවිය යුතු දිනය සලකා ගිණුම්ගත කළ යුතුය. මෙම ප්‍රමාදවීම නිලධාරියාගෙන් බැහැරව සිදුවීමක් ලෙස සලකා කටයුතු කළ යුතුය.

11. මෙම යතුරුපැදි ණය වැඩසටහන යටතේ, ලබාදෙන සියළුම ණය ඉල්ලීම විධායක කමිටුවේ අනුමැතිය හෝ ආවරණ අනුමැතියට යටත්ව සිදුවිය යුතුය.

12. නිලධාරින් සේවා ස්ථාන මාරුවීම් ලබන අවස්ථාවක මෙම නිලධාරියා ලබාගත් ණය මුදලට අදාල වාරික හා පොලි මුදල ගෙන්වා ගැනීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට දිවිනැගුම ප්‍රජා මූල සමිතිය වගබලා ගත යුතුය.

**13.** වෙනත්

12.1 මාසික කේවල ශේෂ පරික්ෂණ ලබාගැනීම අනිවාර්ය වේ.

12.2 මාසික ණය ප්‍රගති වාර්තා සමඟ මෙම ණය වැඩසටහනේ ප්‍රගතිය සකසා එවීමට කටයුතු කළ යුතුය. දැනට හඳුන්වා දී ඇති ප්‍රගති ආකෘති පත්‍ර මේ සඳහා භාවිතා කළ යුතුය.

12.3 යම් ගැටළුවක් හෝ අපැහැදිලි කරුණු පිළිබඳව ක්ෂුද්‍ර මූල්‍ය හා ප්‍රජා මූල බැංකු සමිති අංශයේ නිලධාරි වෙත ලිඛිතව හෝ දුරකථන ඇමතුම් ( 011-3054528/ 0112-669727 / 0112- 696592) මඟින් පැහැදිලි කරගත හැකිය.

ආර්.ඒ.කේ. රණවක,

අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ස.
2. සියලුම ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා - කා.දැ.ස.
3. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස.
4. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කා.දැ.ස.
5. කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කලාප අංක 01,02,03,04,05,06) - අ.ක.ස.
6. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
7. සියලුම ප්‍රදේශිය ලේකම්වරුන්. - කා.දැ.ස.
8. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
10. විගණකාධිපති - කා.දැ.ස.
11. සියලුම අධ්‍යක්ෂවරුන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
12. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරීන් (පාලන හා සමාජ ආරක්ෂණ) - අ.ක.ස.
13. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරීන් (ප්‍රජාමූල සංවිධාන හා ජීවනෝපාය සංවර්ධන) - අ.ක.ස.
14. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරීන් (ක්ෂුද්‍ර මූල්‍ය) - අ.ක.ස.
15. සියලුම කලාප, දිස්ත්‍රික්, ප්‍රාදේශිය, බැංකු කළමනාකරුවන් සහ වසම්භාර දිවිනැගුම නිලධාරින්. - අ.ක.ස.